සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2018** — **10 - ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை - 2018 — தரம் -10
**ThirdTerm Test -2018** — **Grade - 10**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I**
**சிங்களமொழியும் இலக்கியமும் I**
**Business & Accounting studies I**

**පැය එකයි**
**மூன்று மணித்தியாலம் ர**
***One hours***

i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
ii. අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති (1) (2) (3) (4)යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා ගන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් අංකය ට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රය පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලන නිෂ්පාදිත සපයනු ලබන්නේ ව්‍යාපාර විසිනි. ව්‍යාපාර යන්න වඩාත් නිවැරදිව අර්ථ දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.

I. ලාභ ඉපැයීම අරමුණු කරගෙන මුදල් යොදවා කරන ආර්ථික කටයුත්තකි.

II. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ කාර්යයෙහි නිරත ලාභ අරමුණු කරගත් හෝ නොගත් ඕනෑම ආර්ථික කටයුත්තකි.

III. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා සැපයීම සිදුකරන ආර්ථික කටයුත්තකි.

IV. ලාභ අරමුණු කරගත් හෝ නොගත් ඕනෑම ආර්ථික කටයුත්තකි.

2. පහත 'අ' තීරුවේ අවශ්‍යතාවයන් ද 'ආ' තීරුවේ වුවමනාවන්ද දැක්වේ.

| අ | ආ |
|---|---|
| 1. ආහාර | A - රෝහල් |
| 2. ඇඳුම් | B - බත් |
| 3. අධ්‍යාපනය | C - කමිසය |
| 4. සෞඛ්‍යය | D - පාසල |

'අ' තිරුවේ අවශ්‍යතා 'ආ' තිරුවේ වුවමනා සමග නිවැරදිව අනුපිළිවෙලට ගලපා ඇති පිලිතුර තෝරන්න.

I) 1 - B , 2 - C , 3 - A , 4 - D
II) 1 - B , 2 - D , 3 - A , 4 - C
III) 1 - B , 2 - C , 3 - D , 4 - A
IV) 1 - B , 2 - A , 3 - C , 4 – D

3. මිනිස් වුවමනා වල ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. අත්‍යවශ්‍ය වීම හා නිර්මාණය කළ හැකි වීමයි. II. අත්‍යවශ්‍ය නොවීම සහ සීමිත වීමයි.

III. අත්‍යවශ්‍ය නොවීම හා නිර්මාණය කළ හැකි වීමයි. IV. අත්‍යවශ්‍ය වීම හා නිර්මාණය කළ නොහැකි වීමයි.

4. නිෂ්පාදන සාධකයක් **නොවන්නේ,**

I. භූමියයි. II. ශ්‍රමයයි. III. ප්‍රාග්ධනයයි. IV. ලාභයයි.

5. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන් ව්‍යාපාර තුලින් විවිධ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරයි. ඇල්මැති පාර්ශ්වය සහ ඔවුන්ගේ අරමුණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

I. ණගුදෙනුකරුවෝ - අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම II. අයිතිකරුවෝ - ව්‍යාපාරයේ අනාගත වර්ධනය

III. තරඟකරුවෝ - ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම. IV. සේවකයෝ - නිෂ්පාදිත වල මිල තීරණය කිරීම.

6. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදා අධ්‍යයනය කරන අතර බාහිර පරිසරයට පමණක් අයත් වන සාධක පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

I.අයිතිකරුවෝ, කළමණාකරුවෝ, ණගුදෙනුකරුවෝ.

II. කළමනාකරුවෝ, ණගුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ.

III. ණගුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, තරඟකරුවෝ.

IV. සැපයුම්කරුවෝ, තරඟකරුවෝ, සේවකයෝ.

7. ව්‍යාපාර කටයුතු වලට බලපෑම් ඇති කරන අන්තර්ජාලය, විද්‍යුත් තැපෑල, විද්‍යුත් බැංකුකරණය, ණයපත් ආදී සාධක ක්‍රියාත්මක වන පරිසරය

I. ආර්ථික පරිසරයයි. II.සමාජ හා සංස්කෘතික පරිසරයයි. III. නෛතික පරිසරයයි. IV. තාක්ෂණික පරිසරයයි.

**ප්‍රශ්න අංක 8 සහ 9 යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශය අදාල කරගන්න.**

මාලිකා සමරවික්‍රම තම වෙළඳ ව්‍යාපාරය ' මාලිකා ට්‍රේඩර්ස් ' නමින් පවත්වා ගෙන යනු ලබයි.

8. මෙම ව්‍යාපාර අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය,

I. හවුල් ව්‍යාපාර වේ. II.සංස්ථාපිත සමාගම් වේ. III. තනි පුද්ගල ව්‍යාපාර වේ. IV. සමිති සංවිධාන වේ.

9. මෙම ව්‍යාපාරයේ ලියාපදිංචිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. ව්‍යාපාරිකයා තම නමින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසා ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවේ.

II.ව්‍යාපාරිකයාගේ නමෙහි කොටසක් ඇතුළත් බැවින් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවේ.

III. ලියාපදිංචිය අනිවාර්ය නොවුවත් නීතිමය පුද්ගලභාවයක් ලබා ගැනීම සඳහා ලියාපදිංචි කළ යුතුය.

IV. ව්‍යාපාරිකයා තම සම්පූර්ණ නමින් ව්‍යාපාරය පවත්වාගෙන නොයන නිසා ලියාපදිංචි කළ යුතුය.

10. හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව තීරණය කරන්නේ,

I. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත මගිනි. II. වංචා වැළැක්වීමේ ආඥා පනත මගිනි.

III. 2007 අංක 07 දරණ සමාගම් පනත මගිනි. IV. 1918 ව්‍යාපාර නාම ආඥා පනත මගිනි.

11. තනි පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර යන ව්‍යාපාර සංවිධාන වර්ග දෙකටම පොදු වූ ලක්ෂණයකි,

I. ලියාපදිංචිය අනිවාර්ය වීම. II.නෛතික පුද්ගලභාවයක් පැවතීම.

III. වගකීම අසීමිත වීම. IV. අඛණ්ඩ පැවැත්මක් තිබීම.

12. සමාගම් පනත යටතේ හැර වෙනත් නීතියක් යටතේ සංස්ථාපනය කරනු ලබන පූර්ණ අයිතිය හෝ අයිතියෙන් වැඩි ප්‍රමාණයක් රජය සතුවන ව්‍යාපාර,

I. රාජ්‍ය දෙපාර්තමේන්තු නම් වේ. II.රාජ්‍ය සංස්ථා නම් වේ. III. සමූපකාර සමිති නම් වේ.IV. රාජ්‍ය සමාගම් නම් වේ.

13. සමූපකාර සමිති සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක්ද ?

I. ප්‍රාග්ධන සම්පාදන මාර්ග සීමිත වීම. II. අවම සාමාජික සංඛ්‍යාව දෙකක් වීම.

III. සාමාජිකයන්ගේ ශුභ සිද්ධියට ප්‍රමුඛත්වය දීම. Iv. සමූපකාර ප්‍රතිපත්ති මතම කටයුතු කළ යුතු වීම.

14. සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස හඳුන්වන්නේ,

I. ශ්‍රී ලංකා මහ බැංකුවයි. II. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවයි.

III. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවයි. Iv. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයයි.

15. ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර ව්‍යාපාර නාමය ලියාපදිංචිය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ යුත්තේ,

I. දින 07 ක් ඇතුළතය. II. දින 10 ක් ඇතුළතය. III. දින 14 ක් ඇතුළතය. Iv. දින 21 ක් ඇතුළතය.

16. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසියක් හා අවාසියක් පිළිවෙලින් දැක්වෙන්නේ,

I. තාක්ෂණික දෝෂ නිසා දත්ත නැති වීමේ අවදානමක් පැවතීම සහ අවශ්‍ය පරිගණක මෘදුකාංග මිල දී ගැනීමට විශාල මුදලක් වැය වීමයි.

II. දත්ත වෙනස් කිරීමේ අවදානමක් පැවතීම සහා කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීමයි.

III. ගිණුම් වාර්තාවල ඉහළ නිරවද්‍යතාවයක් පැවතීම සහ දත්ත වෙනස් කිරීමේ අවදානමක් පැවතීමයි.

Iv. ගිණුම් වාර්තාවල ඉහළ නිරවද්‍යතාවයක් පැවතීම සහා ගිණුම් වාර්තා ස්වයංක්‍රීයව පිළියෙල කල හැකි විමයි.

**ප්‍රශ්න අංක 17 සහ 18 යන ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී පහත තොරතුරු උපයෝගී කර ගන්න.**

මනෝජ්ගේ ව්‍යාපාරය 2018.09.01 දිනට පහත ගිණුම් ශේෂ පැවතිනි.

| | | | |
|---|---|---|---|
| බැංකු ණය රු. | 200 000 | ණයගැතියෝ රු. | 25 000 |
| ණය හිමියෝ රු. | 20 000 | භාණ්ඩ තොගය රු. | 30 000 |
| ගොඩනැගිලි රු. | 250 000 | මෝටර් රථ රු. | 150 000 |

17. මෙම ව්‍යාපාරයේ 2018.09.01 දිනට ජංගම නොවන වත්කම් වල වටිනාකම ,

I. රු. 20,000 යි. II. රු. 55000 යි . III. රු. 200 000 යි. Iv. රු. 400 000 යි.

18. 2018.09.01 දිනට මනෝජ්ගේ හිමිකම ,

I. රු. 200,000 කි. II. රු. 220 000 කි . III. රු. 235 000 කි.. Iv. රු. 455 000 කි.

19. මධුරගේ ව්‍යාපාරයේ 2018.09.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදිය.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| රු. 800 000 | = | රු. 450 000 | + | රු. 350 000 |

රු. 5000 ක ණය පොලියක් ද සමග රු. 25000 ක බැංකු ණය වාරිකය ගෙවීමෙන් පසු ඉහත ගිණුම්කරණ සමීකරණයෙහි අගය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|---|
| I. | 775 000 | = | 450 000 | + | 325000 |
| II. | 775 000 | = | 430 000 | + | 345000 |
| III. | 775 000 | = | 445 000 | + | 330000 |
| IV. | 770 000 | = | 450 000 | + | 320000 |

20. වැඩි වීම - බැර , අඩු වීම - හර යන ගිණුම්කරණ මූලධර්මය අදාල වනුයේ

I. වත්කම් සහ වියදම් ගිණුම සඳහාය. II. වත්කම් සහ වගකීම් ගිණුම සඳහාය.

IIIවගකීම් සහ ආදායම් ගිණුම සඳහාය. Iv. ආදායම් සහ වියදම් ගිණුම සඳහාය.

21. ගැනුම්, විකුණුම්, ණය පොළී, බැංකු ණය යන එක් එක් ගිණුම් පිළිවෙලින් වර්ග කළ හැක්කේ,

I. වියදම් , ආදායම්, වගකීම්, වගකීම් ලෙසය. II. වත්කම් , ආදායම්, වියදම්, වගකීම් ලෙසය.

IIIවියදම්, ආදායම්, වියදම්,වගකීම් ලෙසය. Iv. වත්කම්, ආදායම් , වියදම්, වියදම් ලෙසය.

22. ගැනිලි ගිණුම අයත් වන්නේ

I. වියදම් ගිණුම් වර්ගයටයි II. හිමිකම් ගිණුම් වර්ගයටයි.

III.වගකීම් ගිණුම් වර්ගයටයි. Iv. වත්කම් ගිණුම් වර්ගයටයි.

23. රු.75000/= ක් වටිනා ලී බඩු ණයට ගැනීමට අදාල ද්විත්ව සටහන වන්නේ

I. ලී බඩු ගිණුම හර රු.75000/=
ණය ගැති ගිණුමබැර රු.75000/=

II ගැනුම් ගිණුමහර රු.75000/=
ණයගැති ගිණුම බැර රු.75000/

III.ලී බඩු ගිණුම හර රු.75000/=
ණය හිමි ගිණුමබැර රු.75000/=

Iv. ණය ගැති ගිණුම හර රු.75000/=
ලී බඩු ගිණුම බැර රු.75000/=

24. පහත සඳහන් ද්විත්ව සටහනට අදාල නිවැරදි ගණුදෙනුව දැක්වෙන පිළිතුර තෝරන්න

ගැනිලි ගිණුම හර රු.10000/=

මුදල් ගිණුම බැර රු.10000/=

I. රු.10000/= ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.

II. ව්‍යාපාරයේ අයිතිකරු රු.10000/= ක භාණ්ඩ තොගයක් පුද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

III. ව්‍යාපාරයේ අයිතිකරු රු.10000/= ක මුදලක් තම පුද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

Iv. රු.10000/= ක් වටිනා භාණ්ඩ තොගයක් මුදලට විකිණීම.

25. නැවත විකිණීම සඳහා වෙළඳ භාණ්ඩ ණයට ගැනීම සටහන් කරන මූලික පොත හා මූලාශ්‍ර ලේඛනය පිළිවෙලින් නම් කල විට එය

I. විකුණුම් ජ'නලය සහ ඉන්වොයිසිය නම් වේ.　　II. ඉන්වොයිසිය සහවිකුණුම් ජ'නලයනම් වේ.

IIIගැණුම් ජ'නලය සහ ඉන්වොයිසිය නම් වේ.　　Iv. ඉන්වොයිසිය සහගැණුම් ජ'නලයනම් වේ.

26. මුදල් පොතේ ලැබීම් පැත්තේ ගණුදෙනු සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ

I. ගෙවීම් වව්චරයයි.　II. ලදුපතයි.　IIIහර පතයි　Iv. පිළි පතයි

27. පහත X තීරුවේ මූලික සටහන් පොත්ද Y තීරුවේ මූලාශ්‍ර ලේඛනද දැක්වේ.

| X | Y |
|---|---|
| 1පොදු ජ'නලය | Aතැන්පත් කිරීමේ කුවිතාන්සිය |
| 2 බැංකු ගිණුම | Bජ'නල් වව්චරය |
| 3සුළු මුදල් පොත | C සුළු මුදල් ගෙවීම් වව්චරය |

X තීරු හා Yතීරු නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

I. 1-A　2-B　3-C　　II. 1-B　2-A　3-C

III. 1-C　2-B　3-A　　Iv.1-C　2-A　3-B

28. 2018.09.01දින සුළු මුදල් භාරකරු සතුව රු.210/=ක මුදලක් ඉතිරිව තිබුණි. 2018.08.31 දිනට සුළු මුදල් වියදම් රු. 4790/=කි. සෑම මසකම පළමුවන දින අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම හා 2018.09.01 දිනට සුළු මුදල් භාරකරු විසින් ප්‍රතිපූර්ණය කරගතයුතු මුදල වන්නේ

I. රු. 4790/= සහ රු. 210/= යි.　　II. රු. 4790/= සහ රු. 5000/= යි.

III.රු. 5000/= සහ රු. 210/= යි.　　Iv .රු. 5000/= සහ රු. 4790/= යි.

29. ලකුණුකල මිල රු.20000/= ක් වන භාණ්ඩයක් මිලදී ගැනීමේදී 5% ක වෙළඳ වට්ටමක් ලබාදේ. මෙම භාණ්ඩය ණයට ලබා ගත් ලක්මාල්ට සතියක් තුලදී මුදල් ගෙවන්නේ නම් 2% මුදල් වට්ටමක් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී. අදාල කාල සීමාව තුල ලක්මාල් ගනුදෙනුව පියවූයේ නම් ගෙවිය යුතු මුදල වන්නේ,

I. රු. 18620/= කි　II. රු. 19000/= කි　III.රු. 19600/= කි　Iv .රු. 20000/= කි

30. විසල් නම් ණයගැතියාගෙන් ලැබී බැංකුගත කල රු. 15000/- ක චෙක්පත අගරු වීමට අදාල නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

I. විසල්ගේ ගිණුම හර රු. 15000/-
අගරු චෙක්පත් ගිණුම බැර රු. 15000/-

II. අගරු චෙක්පත් ගිණුම හර රු. 15 000/-
විසල්ගේ ගිණුම බැර රු. 15 000/-

III.බැංකු ගිණුම හර රු. 15 000/-
විසල්ගේ ගිණුම බැර රු. 15 000/-

Iv .විසල්ගේ ගිණුම හර රු. 15 000/-
බැංකු ගිණුම බැර රු. 15 000/-

31. සංශෝධිත බැංකු ගිණුම සකස් කිරීමේදී උපයෝගි කරගනු **<u>නොලබන අයිතමය</u>**

I. ස්ථාවර නියෝග මත කළ ගෙවීමය. II. සෘජු ප්‍රේෂණය.

III.තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්ය. Iv .බැංකු ගාස්තුය.

32. ව්‍යාපාරයක් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ ප්‍රධානතම පරමාර්ථය වන්නේ

I. ව්‍යාපාරයේ ගිණුම් තැබීමේ නිවරද්‍යතාවය පරීක්ෂා කිරීමයි.

II. බැංකු ගිණුමේ සහ බැංකු ප්‍රකාශයේ ශේෂ එකිනෙකට අසමාන වීමට හේතු වූ කරුණු අනාවරණය කර ගැනීමයි.

III.බැංකු ගිණුමේ සිදුවූ වැරදි අනාවරණය කර ගැනීමයි.

Iv .බැංකුව විසින් කර ඇති වැරදි අනාවරණය කර ගැනීමයි.

33. බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමට උපකාර කර ගන්නා මූලාශ්‍රයක් වන්නේ,

I. චෙක් පිළිපතයි. II. චෙක්පත් බැර තුන්ඩුවයි. III.අගරු චෙක්පත් නිවේදනයයි. Iv .බැංකු ප්‍රකාශනයයි.

34. ගැණුම් ජ'නලය පිළිබඳව දැක්වෙන පහත ප්‍රකාශ වලින් **<u>සාවද්‍ය</u>** ප්‍රකාශය තෝරන්න

I. ගැණුම් ජ'නලයේ එකතුව ගැණුම් ගිණුමට හර කරයි.

II. ගැණුම් ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ ගැණුම් ඉන්වොයිසියයි.

III.ව්‍යාපාරයේ සියලූම ගැණුම් ගැණුම් ජ'නලයේ සටහන් කරයි.

Iv .නැවත විකිණීමේ පරමාර්ථයෙන් කෙරෙන ණයට ගැණුම් පමණක් ගැණුම්ජ'නලයේ සටහන් කරයි.

35. සීමා සහිත නිව් ලංකා ලී බඩු සමාගම තම කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු. 250 000 ක කාර්යාල උපකරණ සීමා සහිත තරංගා සමාගමෙන් ණයට ලබා ගන්නා ලදී. මෙම ගණුදෙනුව සටහන් කිරීමට අදාල මූලික පොත සහ මූලාශ්‍ර ලේඛනය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

I. මුදල් පොත - ගෙවීම් වව්චරය II. ගැනුම් ජර්නලය - ඉන්වොයිසිය

III.පොදු ජර්නලය - ජර්නල් වව්චරය Iv .විකුණුම් ජර්නලය - ඉන්වොයිසිය.

36. අවිනිශ්චිත ගිණුමක රු. 1500/- ක බැර ශේෂයක් පැවතීමට හේතුවක් විය හැක්කේ,

I. චෙක්පතකින් ගෙවා දැමූ රු. 750/- ක විදුලි බිල බැංකු ගිණුමට හර කර විදුලි වියදම් ගිණුමට බැර කිරීමයි.

II. රු. 1500/- ක දුරකථන වියදම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ සටහන් නොවීම.

III.රු. 1500/- ක මිලට ගැනුම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර ගැනුම් ගිණුමේ දෙවරක් සටහන් කිරීමයි.

Iv .රු. 1500/- ක විකුණුම්, විකුණුම් ගිණුමේ සටහන් නොවීමයි.

37. මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව ගිණුම්ගත කිරීමට අදාල ජර්නල් සටහන වන්නේ

I. ණය හිමි ගිණුම හර ලද වට්ටම් ගිණුම බැර II. ලද වට්ටම් ගිණුම හර ණයහිමි ගිණුම බැර

III.දුන් වට්ටම් ගිණුම හර ණයගැති ගිණුම බැර . Iv .ණයගැති ගිණුම හර දුන් වට්ටම් ගිණුම බැර

38. කපිල ව්‍යාපාරයේ රු5000/= ක ගොඩනැගිලි අලුත් වැඩියා වියදම් මුදල් පොතේ පමණක් සටහන් වී ඇත. මේ නිසා

I. ශේෂ පිරික්සුමේ බැර පැත්තේ එකතුව රු.5000/=කින් අඩු වේ.

II. ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු.5000/=කින් අඩු වේ.

III.ශේෂ පිරික්සුමේ බැර පැත්තේ එකතුව රු.10000/=කින් අඩු වේ.

Iv .ශේෂ පිරික්සුමට බලපෑමක් ඇති නොවේ.

39. අවිනිශ්චිත ගිණුමක් බිහි වීම කෙරෙහි බලපාන ගණුදෙනුව වන්නේ,

I. රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් මූලික පොත්වල සටහන් නොකිරීමයි.

II. රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් රු. 1000 ක් ලෙස සටහන් කිරීමයි.

III.රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් අදාල ගිණුම් වල දෙවරක් සටහන් වීමයි.

Iv .රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් විකුණුම් ලෙස සටහන් වීමයි.

40. පහත දැක්වෙන්නේ ව්‍යාපාර ගනුදෙනුවක් වැරදි ලෙස සටහන් වීම නිවැරදි කළ පසු ජ'නල් සටහන වේ
ගැණුම් ගිණුම හර රු.500/=

අවිනිශ්චිත ගිණුම බැර රු.500/=

අදාල වරද වන්නේ

I. ගැණුම් ගිණුමේ එකතුව රු.500/=ක් අඩුවෙන්ශේෂපිරික්සුමේ සටහන් කිරීමයි.

II. ගැණුම් ගිණුමට රු.500/=බැගින් දෙවරක් හර කිරීමයි.

III.රු.500/=ක ගැණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මග හැරීමයි.

Iv .ගැණුම් ගිණුමේ එකතුව රු.1000/=ක් අඩුවෙන'ශේෂ පිරික්සුමට ගෙනයාමයි.

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය- 2018** 11 -ශ්‍රේණිය

மூன்றாம் தவணைப் பரீட்சை - 2018 தரம் - 11

**ThirdTerm Test -2018** **Grade - 11**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**

**சிங்களமொழியும் இலக்கியமும் II**

**Business & Accounting studies II**

**පැය දෙකයි**

**மூன்று மணித்தியாலம் ர**

**Tow hours**

**පළවෙනි ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න 2 ක් ද II කොටසින් ප්‍රශ්ණ දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 1 ට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් සිද්ධිය අදාල කර ගන්න.**

1) වසර ගණනාවක් විදේශ රටක සේවය කිරීමෙන් පසු මෙරටට පැමිණි විරංග2018.01.01 දින ළමා පත්තර මුද්‍රණය කර අලෙවි කරන වෙළඳසැලක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයේ කළමණාකරු ලෙස සේවය කිරීමට එකඟව ඔහුගේ ඥාති සොහොයුරෙකු වූ එරංග ද මෙම ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. ''රංග පොත් ප්‍රකාශකයෝ '' යන නමින් ආරම්භ කල මෙම ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසය තුල පහත සඳහන් ගණුදෙනු සිදුවිය.

2018.01.01 විරංග රු. 1000 000 ක් මුදලින් ද පත්තර බෙදාහැරීම සඳහා රු. 1,500 000 ක් වටිනා තම මෝටර් රථය ද ව්‍යාපාරයට යොදවන ලදි. එරංග මුදලින් රු. 500 000 ක් ද ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා රු. 1 000 000 ක් වටිනා තම ගොඩනැගිල්ල ද ව්‍යාපාරයට යොදවන ලදී.

2018.01.02 රු. 1, 000,000 ක් යොදා බැංකු ජංගම ගිණුමක් ආරම්භ කල අතර සියළු ගෙවීම් චෙක්පත් මගින් සිදු කිරීමට තීරණය කරන ලදී.

2018.01.05 එක් අයෙකුගේ මාසික වැටුප රු. 25,000 ක් ගෙවීමේ එකඟතාවය මත පුහුණු සේවකයන් දෙදෙනෙක් බඳවා ගන්නා ලදී

2018.01.10 රු. 2,000,000 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් සීමිත රසාංග සහ සමාගමෙන් ණයට ලබා ගන්නා ලදී.

2018.01.12 මුද්‍රණ කඩදාසි සහ මුද්‍රණ තීන්ත මිලට ගත්තා රු. 100,000

2018.01.15 බැංකු ණයක් ලැබුනා රු. 500,000

2018.01.17 රු. 25,000 ක පත්තර අලෙවි කල අතර ඒ සඳහා චෙක්පතක් ලැබුණි.

2018.01.18 රු. 20 000 ක මුද්‍රණ තීන්ත සීමිත ආලෝකා සමාගමෙන් ණයට ගත්තා.

2018.01.20  2018.01.17 දින ලද චෙක්පත බැංකු ගත කලා.

2018.01.22  හසිනි පොත් ප්‍රකාශකයන්ට පත්තර ණයට අලෙවි කලා.රු. 10 000

2018.01.24  සේවක වැටුප් ගෙව්වා රු. 55,000

2018.01.25 ණය වාරික ගෙව්වා රු. 25 000

2018.01.26 සීමිත ආලෝකා සමාගමට චෙක්පතක් නිකුත් කලා. රු. 10 000.

2018.01.27 හසිනි පොත් ප්‍රකාශකයන්ගෙන් රු.8000 ක චෙක්පතක් ලැබුණු අතර එය එදිනම බැංකුගත කලා.

2018.01.28  ජනවාරි මාසයට අදාල විදුලි බිල්පත ලැබුණා. රු. 30, 000

2018.01.29 සීමිත ආලෝකා සමාගමට නිකුත් කල රු. 10, 000 චෙක්පත අගරු වූ බව බැංකුව දැනුම් දුන්නා.

2018.01.30 රක්ෂණ වාරිකය ගෙව්වා රු. 25,000

2018.01.31 සීමිත රසාංග සහ සමාගමට ණය වාරිකය ගෙව්වා රු. 100 , 000

සේවකයන්ගේ කාර්යක්ෂමතාවයත්, ළමා පත්තර වල තිබූ ආකර්ශනීය බව හා පිරිසිදු නිමාව නිසාත් ව්‍යාපාරයට නව ඇණවුම් ගණනාවක් ලැබුණි. මෙම වර්ෂය නිමාවත් සමග මෙම ව්‍යාපාරය නවතම කාන්තා පුවත්පතක් ද නිකුත් කිරීමට සැලසුම් කරමින් සිටියි.

I. අ) පෞද්ගලික අංශයට අයත් ලාභ අරමුණු කරගත් මෙම ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයටද ? (ල.01)
   ආ) එහි අවාසි සහගත ලක්ෂණයක් ලියන්න. (ල.01)

II. අ)එරංග මෙම ව්‍යාපාරයේ හිමිකරුවෙක්ද? සේවකයෙක් ද? (ල.01)
   ආ)ඔබ එසේ පවසන්නේ ඇයි? (ල.01)

III. මෙම ව්‍යාපාරය තුලින් දැකිය හැකි ශක්තියක් හා ව්‍යාපාරයට බලපාන අවස්ථාවක් ලියන්න. (ල.02)

IV. අ) ''රංග පොත් ප්‍රකාශකයෝ '' යන ව්‍යාපාර නාමය ලියාපදිංචි කල යුතුද ? ඒ ඇයි? (ල.01)
   ආ) සීමිත ආලෝක සමාගමට නිකුත් කල චෙක්පත අගරු වීමට බලපෑ හැකි යැයි ඔබ සිතන හේතුවක් ලියන්න. (ල.01)

V. 2018.01.01 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න. (ල.02)

VI. 2018.01.01 දිනට ව්‍යාපාරය සතු වූ ජංගම නොවන වත්කමක් හා ජංගම වත්කමක් වටිනාකම ද සමග ලියන්න. (ල.02)

VII. 2018.01.17 දින සිදු වූ ගණුදෙනුවට අදාල වන මූලික ලියවිල්ල සහ මූලික පොත නම් කරන්න. (ල.02)

VIII. මෙම මාසය තුල මෙම ව්‍යාපාරය තුල සිදු වී ඇති සිද්ධියකට නිදසුනක් ලියන්න. (ල.02)

IX. 2018.01.27 දින සිදු වූ ගණුදෙනුවට අදාල ද්විත්ව සටහන ලියන්න. (ල.02)

X. 2018.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ශේෂය ගණනය කරන්න. (ල.02)

## *I* කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

2) i.(අ) ව්‍යාපාර විසින් තම සේවකයන් වෙනුවෙන් ලබා දෙන සේවක සුභසාධන පහසුකම් 2 ක් ලියන්න. (ල.01)

(ආ)භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා සැපයීමේ ව්‍යාපාර සඳහා නිදසුන බැගින් වෙන වෙනම දක්වන්න. (ල.01)

ii. පහතසඳහන් අවශ්‍යතාවයන් මූලික මිනිස් අවශ්‍යතා සහ සමාජය සංකීර්ණ වීමත් සමග ඇති වූ අවශ්‍යතා ලෙස වර්ග කර දක්වන්න. අධ්‍යාපන, ආහාර, ආරක්ෂාව, ඇඳුම් (ල02)

iii. රස කැවිලි නිෂ්පාදන ආයතනයක් භාවිතා කරන පහත දේ නිෂ්පාදන සාධක යටතේ වර්ග කර දක්වන්න.
පාන්පිටි, ජලය, රස කැවිලි සකස් කරන උපකරණ , සහායක සේවකයන් (ල.02)

iv. පහත සඳහන් ප්‍රකාශන සත්‍ය නම් √ ලකුණ ද අසත්‍ය නම්× ලකුණ ද යොදන්න. (ල.02)

i. පාරිභෝගික තෘප්තිය ඉහල නැංවීම පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණකි. (.......)
ii. තමාට අවශ්‍ය සියලු දේ තමා විසින්ම නිපදවා ගැනීම බාටර් ක්‍රමය නම් වේ. (.......)
iii. යම් ව්‍යාපාරයක් විසින් නිෂ්පාදනය කරන නිෂ්පාදන වලට සමාන නිෂ්පාදිත නිෂ්පාදනය හෝ අලෙවි කිරීම සිදුකරන්නන් සැපයුම් කරුවන් නම් වේ. (......)
iv. ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරිගැන්වීම් ලබා ගැනීම රජයෙන් ව්‍යාපාර අපේක්ෂා කරන දායකත්වයට නිදසුනකි. (......)

3) i.(අ) ව්‍යාපාර පරිසරය යන්න හඳුන්වන්න. (ල.01)

(ආ) ව්‍යාපාර කෙරෙහි රජය මැදිහත් වන ආකාර 02 ක් ලියන්න. (ල.01)

ii. අ)ආර්ථික පරිසරයට අයත් උප සාධක දෙකක් නම් කරන්න. (ල.01)

(ආ)තාක්ෂණික පරිසර සාධක නිසා ව්‍යාපාරවලට සිදුවන යහපත් බලපෑම් දෙකක් සඳහන් කරන්න.(ල.01)

iii.ව්‍යාපාරයක බාහිර සහ අභ්‍යන්තර පරිසර අධ්‍යයනය කිරීම තුලින් ව්‍යාපාරිකයාට හඳුනා ගත හැකි යහපත් බලපෑම් සහ අයහපත් බලපෑම් දෙක බැගින් ලියන්න. (ල.02)

v. අ)නව තාක්ෂණය භාවිතයෙන් සිදුකරන ව්‍යාපාර කටයුතු 02 ක් සඳහා නිදසුන් සපයන්න. (ල.01)
ආ) ජංගම දුරකථන බැංකු ක්‍රමයේ වාසි 2 ක් දක්වන්න.

4) i.(අ) ව්‍යාපාර වර්ග කල හැකි ආකාර 2 ක් ලියන්න. (ල.01)

(ආ)පහත සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ග අතරින් නීතිමය පුද්ගලභාවයක් පවතින්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ග වලටද? (ල.01)
කේවල ස්වාමි ව්‍යාපාර, සමූපකාරය, රාජ්‍ය සංස්ථා , රජයේ දෙපාර්තමේන්තු

ii.(අ)හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර 2ක් නම් කරන්න.(ල.01)

(ආ)කේවල ස්වාමි ව්‍යාපාරයක් සහ හවුල් ව්‍යාපාරයක් අතර ඇති වෙනස්කම් 2 ක් ලියන්න(ල.01)

iii.(අ)සංස්ථාපිත සමාගම් පහත සඳහන් කාර්යයන් ඉටු කරන්නේ කෙසේද? (ල.02)
1. කළමනාකරණ කටයුතු 2.ප්‍රාග්ධන සම්පාදනය

(ආ)රාජ්‍ය සංස්ථාවල දැකියහැකි ලක්ෂණ 2ක් සඳහන් කරන්න (ල.01)

iv. අ) ශ්‍රී ලංකාවේ සේවා සැපයීම සඳහා දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය දෙපාර්තමේන්තු 2 කට නිදසුන් දක්වන්න. (ල.01)

ආ)කේවල ස්වාමි ව්‍යාපාරයකට තම නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ 2 ක් සඳහන් කරන්න (ල.01)

## II කොටස - ගිණුම්කරණය

ප්‍රශ්න 2 කට පමනක් පිළිතුරු සපයන්න.

5) i.(අ)ගණුදෙනුවක් යනු කුමක්ද? (ල.01)

(ආ)වත්කම් අර්ථ දක්වන්න (ල.01)

ii. අපර්ණාගේ ව්‍යාපාරයේ 2018 සැප්තැම්ර් මාසය තුල සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| දිනය | වත්කම්= | | | හිමිකම්+ | වගකීම් | |
|---|---|---|---|---|---|---|
| | භාණ්ඩ තොගය | ණය ගැතියෝ | මුදල් | ප්‍රාග්ධනය | බැංකු ණය | ණයහිමියන් |
| 2018/09 /01 ශේෂයන් | 100000 | - | 100000 | ? | 50000 | - |
| 2018/09 /05 | - | - | +150000 | +150000 | | |
| 2018/09 /12 | +50 000 | - | - | | | +50 000 |
| 2018/09 /18 | −30 000 | + 50 000 | - | +20 000 | | |
| 2018/09 /25 | | −10 000 | +9 000 | −1 000 | | |

සැලකිය යුතුයි,
2018 සැප්තැම්බර් මාසය තුල අපර්ණා ව්‍යාපාරයට අමතර ප්‍රාග්ධනයක් යොදා නොමැත.

අවශ්‍ය වන්නේ

1. 2018 සැප්තැම්බර් මාසය තුල සිදුවී ඇතැයි සැලකිය හැකි ගනුදෙනු දින අනුපිළිවෙලට ලියන්න. (ල.4)
2. 2018/09/30 දිනට අපර්ණාගේ හිමිකම ගණනය කරන්න.( ල.1 )

Iii පහත සදහන්ගනු දෙනු සදහා ද්විත්ව සටහන් ලියන්න.( ල. 5 )

1. සීමාසහිත ජිනසේන සමාගමෙන් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සදහා යන්ත්‍රයක් ගත්තා රු. 100000
2. සේවක වේතන රු.25000 ක් චෙක් පතකින් ගෙව්වා.
3. ව්‍යාපාරයේ වියදම් සදහා රු. 100000ක් බැංකු ගිණුමෙන් ලබා ගත්තා.
4. ණයගැති සමන්ගෙන් චෙක්පතක් ලැබී එය එදිනම බැංකු ගත කලා. රු. 30 000 යි.
5. අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සදහා චෙක් පතක් ලියා මුදල් ලබා ගත්තා රු.5000

6) i. (අ) මූලාශ්‍ර ලේඛන වල සාමාන්‍යයෙන් අන්තර්ගත වන කරුණු දෙකක් ලියන්න. (ල.01)

(ආ) මූලික සටහන් පොත් වල සහ මූලාශ්‍ර ලේඛන අතර ඇති සම්බන්ධතාවය කුමක්ද? (ල.01)

ii. පළතුරු සහ එළවළු මිලට ගෙන අලෙවි කරන හේෂාන්ගේ ව්‍යාපාරයේ 2018 ඔක්තෝම්බර් මාසය සඳහා පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ඉන්වොයිසියේ සඳහන් වටිනාකම (රු) | අඩුකල වෙළඳ වට්ටම |
|---|---|---|---|---|
| 2018/10/08 | 112 | මුදිත | 35000 | 5% |
| 2018/10/21 | 35 | කරුණාරත්න ව්‍යාපාරිකයෝ | 20000 | - |
| 2018/10/30 | 118 | මුදිත | 15000 | - |

අවශ්‍යවන්නේ

1. ඉහත තොරතුරු සටහන් කිරීමට අදාල මූලික පොත පිලියෙල කරන්න. (ල.03)
2. අදාල ලෙජර් ගිණුම පිලියෙල කරන්න. (ල.02)

iiiපහත දැක්වෙන්නේ ධනවර්ධන ව්‍යාපාරයේ 2018 ඔක්තෝම්බර් මාසය සඳහා පිළියල කල සුළු මුදල් පොතයි.

සුළු මුදල් පොත

| ලැබීම් රු. | දිනය | වවුචර් අංකය | විස්තරය | වටිනාකම රු. | විශ්ලේශන තීරු | | | | ලෙජර් | ලෙ.පි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | තැපැල් | ගමන් | ලිපිද්‍රව්‍ය | සංග්‍රහ | | |
| 1000 | 2018/10/01 | - | ශේෂය ඉ/ගෙ | | | | | | | |
| 2000 | 2018/10/01 | | මුදල් | | | | | | | |
| | 2018/10/03 | 1 | තැපැල් | 360 | 360 | | | | | |
| | 2018/10/05 | 2 | සංග්‍රහ | 400 | | | | 400 | | |
| | 2018/10/9 | 3 | ලිපිද්‍රව්‍ය | 220 | | | 220 | | | |
| | 2018/10/12 | 4 | මුද්දර | 200 | 200 | | | | | |
| | 2018/10/15 | 5 | ගෙන ඒමේ කුලී | 500 | | | | | 500 | |
| | 2018/10/18 | 6 | හාර්ඩ්ට් | 300 | | | 300 | | | |
| | 2018/10/21 | 7 | ගමන් වියදම් | 120 | | 120 | | | | |
| | 2018/10/25 | 8 | විජය ව්‍යාපාරිකයෝ | 500 | | | | | 500 | |
| | 2018/10/28 | 9 | ත්‍රීවිලර්ගාස්තු | 200 | | 200 | | | | |

(අ) පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. 2018.10.31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදලකීයද? (ල.01)
2. 2018.11.01 දිනට ප්‍රධාන මුදල් භාරකරු ප්‍රතිපූර්ණය කරන සුළු මුදල් ප්‍රමාණය කොපමණද? (ල.01)

(ආ) විශ්ලේෂණ තීරු වල වටිනාකම් ලෙජරයට පිටපත් කරන්න (ල.01)

7) i. (අ)බැංකුව ව්‍යාපාරයට අදාල බැංකු ගිණුමේ ගනුදෙනුසටහන් කරනු ලබන්නේ කුමන රීතියට අනුවද?(ල.01)

(ආ)ගිණුම්කරණයේදී සිදුවන වැරදි කොටස් දෙකකට බෙදිය හැක ඒවා නම් කරන්න (ල.01)

ii. කසුන්ගේ ව්‍යාපාරයේ 2018 ඔක්තෝම්බර් මාසයට අදාලව සකස් කල බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු.6400කි. බැංකු ප්‍රකාශනයේ සදහන් ශේෂය මෙයට වඩා වෙනස් වූ අතර පසුව සොයා ගන්නා ලද වෙනසට හේතු වූ කරුණුපහත පරිදි වේ.

(අ)ස්ථාවර නියෝග මත බැංකුව සිදුකල ණය වාරික ගෙවීම් රු.3200කි.

(ආ)ඔක්තෝම්බර් මාසය තුල තැන්පත් කල නමුත් නිශ්කාෂනය නොවූචෙක්පත්වල වටිනාකම රු.11400කි.

(ඇ)බැංකුවට සෘජුවම ලැබී ඇති ණය ගැති ප්‍රේෂණ රු.7000කි.

(ඈ)බැංකුව අයකල බැංකු ගාස්තු රු. 500කි.

(ඉ)ඔක්තෝම්බර් මාසය තුල නිකුත් කල නමුත්එම මාසය තුල ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු.8400 කි.

අවශ්‍යවන්නේ,

1. 2018.10.31 දිනට බැංකු ගිණුම සංශෝධනය කිරීම (ල.02)
2. 2018.10.31 දිනට බැංකු සැසදුම් ප්‍රකාශනය පිලියෙල කිරීම (ල.02)

Iii චාමින්දගේ ව්‍යාපාරයේ 2018.10.31 දිනට සකස් කල ශේෂ පිරික්සුම සම නොවූ අතර එහි වෙනස වූ රු. 3200 අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදී.පහත සදහන් වැරදි පසුව සිදුකල පරීක්ෂාවේ දී සොයා ගන්නා ලදී.

1. යන්ත්‍ර අළුත් වැඩියා කිරීමේ වියදමවූ රු. 10000 යන්ත්‍ර ගිණුමට හර කර ඇත.
2. රු.25000 ක ගැණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වල සටහන් කිරීම සම්පූර්ණයෙන්ම මඟ හැරී ඇත.
3. රු. 5000 ක ණය හිමියන්ට ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
4. රු.200ක් වූ ලිපිද්‍රව්‍ය වියදම ලිපිද්‍රව්‍ය ගිණුමේ රු.2000ක් ලෙස සටහන් කර ඇත.

අවශ්‍යවන්නේ,

1. ඉහත සදහන් වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් (ල.04)
2.අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම. (ල.02)

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පිළිතුරු පත්‍රය

| 10ශ්‍රේණිය | | කාලය පැය 01 |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| 1) | ( 2) | 21) | (3) |
| 2) | ( 3) | 22) | (2) |
| 3) | ( 3) | 23) | (3) |
| 4) | ( 4) | 24) | (3) |
| 5) | ( 2) | 25) | (3 ) |
| 6) | ( 3) | 26) | (2) |
| 7) | ( 4 ) | 27) | (2) |
| 8) | ( 3) | 28) | (4) |
| 9) | ( 4) | 29) | (1) |
| 10) | ( 3) | 30) | (4) |
| 11) | ( 3) | 31) | (3) |
| 12) | ( 2) | 32) | (2) |
| 13) | ( 2) | 33) | (4) |
| 14) | ( 2) | 34) | (3) |
| 15) | ( 3) | 35) | (3) |
| 16) | ( 3) | 36) | (2) |
| 17) | ( 4 ) | 37) | (3) |
| 18) | ( 3) | 38) | (2) |
| 19) | ( 3) | 39) | (2) |
| 20) | ( 3) | 40) | (1) |

## පිළිතුරු පත්‍රය

### 02 වන කොටස

1) i) අ) හවුල් ව්‍යාපාර (ල.01)

ආ) - වගකීම අසීමිත වීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
- ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම.
- හවුල්කරුවන් අතර මතභේද ඇති විය හැකි වීම.

(නිවැරදි එක් පිළිතුරකට ල.01)

ii) අ) හිමිකරුවෙකි. (ල.01)

ආ) ව්‍යාපාරය සදහා මුදලින් රු. 500,000 ක් ද රු. 1, 000, 000 ක් වටිනා ගොඩනැගිල්ල ද ව්‍යාපාරයට යොදවා තිබීම. (වටිනාකම් සහිතව ලියූ නිවැරදි පිළිතුරට ල. 01 එසේ නොමැතිව ලියා ඇත්නම් ල. 1/2)

iii) අ) ශක්තියක් - අයිතිකරුවන් සතුව මුල්‍ය ශක්තියක් පැවතීම.
- ව්‍යාපාර කටයුත්ත පිළිබඳ මනා දැනුමක් පැවතීම.
- කාර්යක්ෂම සේවකයන් සිටීම.
- ව්‍යාපාරය සම්පත් සහිත වීම.

(නිවැරදි පිළිතුරට ල.01)

අවස්ථාවක් - ළමා පත්තර සදහා නව ඇණවුම් ගණනාවක් ලැබීම.
- කාන්තා පුවත්පතක් ද මුද්‍රණය කිරීමට සූදානම් වීම.
- ළමා පත්තර වල ආකර්ශණීය නිමාව

(නිවැරදි පිළිතුරකට ල.01)

iv) අ) ඔව් (ල.1/2)

අයිතිකරුගේ සම්පූර්ණ නම් වලින් හැර වෙනත් නමකින් පවත්වා ගෙන යන නිසා (ල. 1/2)

ආ) - අයිතිකරුගේ අත්සන අවිධිමත් වීම.
- චෙක්පත අවිධිමත්ව ලියා තිබීම.
- චෙක්පත විකල වී තිබීම.

(පිළිගත හැකි නිවැරදි එක කරුණකට ල.01 බැංකු ජංගම ගිණුමේ මුදල් නොමැති වීම යන කරුණට ලකුණු දෙන්න එපා.)

v) විරංගගේ හිමිකම - රු. 2, 500,000
එරංගගේ හිමිකම - රු. 1, 500,000
මුළු හිමිකම = රු. 3, 000 000 (ල. 02)

(විරංගගේ සහ එරංගගේ හිමිකම වෙන වෙනම ලියා ඇත්නම් ල. 1/2 බැගින් දෙන්න)

vi)

| ජංගම නොවන වත්කම් | ජංගම වත්කම් |
|---|---|
| මෝටර් රථය රු. 1.500,000 | මුදල් රු. 1.500,000 (ල.01) |
| ගොඩනැගිල්ල රු. 1.000,000 | (වටිනාකම සහිත පිළිතුරට ල.01 |

**(එක නිදසුනකට වටිනාකම සහිතව ලකුණු 01 වටිනාකම නොමැති නම් ල. 1/2**

vii) මූලික ලියවිල්ල - ලදුපත ( ල. 01)
මූලික පොත - මුදල් පොත (ල. 01)

viii) - ජනවාරි මාසයට අදාල විදුලි බිල්පත ලැබුණා.
මාසික වැටුප් රු. 15, 000 ක් ගෙවීමේ එකගතාවය මත පුහුණු සේවකයන් දෙදෙනෙක් බඳවා ගත්තා. (එක් සිද්ධියක් ලිවීම සඳහා ල. 02)

ix) බැංකු ගිණුම හර රු. 8 000 (ල.01)
හසිනි පොත් ප්‍රකාශකයෝ /ණයගැති ගිණුම බැර (ල.01)
x) රු. 1. 228, 000 ( ල.02)

2) i.(අ)- නොමිලේ ආහාර පාන ලබාදීම
- නොමිලේ නවාතැන් පහසුකම් ලබාදීම
- නොමිලේ ප්‍රවාහන පහසුකම් ලබාදීම
- නොමිලේ වෛද්‍ය පහසුකම් ලබාදීම
(පිළිගත හැකි නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සඳහා ල.01)

(ආ)භාණ්ඩනිෂ්පාදනව්‍යාපාර - මෝටර් රථ, විදුලි උපකරණ,ගෘහභාණ්ඩ, ජංගම දුරකතන
(පිළිගත හැකි නිදසුනකට ල.1/2 )

සේවා සැපයීමේ ව්‍යාපාර -තොග වෙළෙඳ ආයතන ,සිල්ලර වෙළෙඳ ආයතන
-රක්ෂණ ආයතන, බැංකු ආයතන, අධ්‍යාපන ආයතන
(පිළිගත හැකි නිදසුනට ල.1/2 )
iiමූලික මිනිස් අවශ්‍යතා - ආහාර, ඇඳුම්
(නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් පිළිතුරු 02 සඳහා ල.01)

සමාජය සංකීර්ණවීමත් සමග ඇතිවූ අවශ්‍යතා - අධ්‍යාපනය, ආරක්ෂාව
(නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් පිළිතුරු 02 සඳහා ල.01)

iii. භූමිය - ජලය (ල.1/2)
ශ්‍රමය - සහායක සේවකයා
ප්‍රාග්ධනය - පාන්පිටි, රසකැවිලි සකස්කරන උපකරණ
(එක් පිළිතුරකට ල.1/2 බැගින් පිළිතුරු 02 සඳහා ල.01)
iv.
i. √
ii. ×
iii. ×
iv. √
(නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් නිවැරදිපිළිතුරු 04 සඳහා ල.02)

3)i.(අ)ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව ව්‍යාපාර පරිසරය නම් වේ.(ඉරි ඇඳි පද සහිත නිවැරදි පිළිතුරසඳහා ල.01එසේ නොමැතිනම් ල. 1/2)

(ආ)- යටිතල පහසුකම් සැපයීම
- පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම
- ව්‍යාපාර ලියාපදිංචි කිරීම
- ව්‍යාපාර කටයුතු සඳහා බලපත්‍ර ලබා දීම
- සේවක සුරක්ෂිතතාව සඳහා කටයුතු කිරීම

(පිළිගත හැකි නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සඳහා ල.01)

ii (අ)පොළී අනුපාතය, උද්ධමනය, ආදායම් ව්‍යාප්තිය, සේවා නියුක්තිය,ජාත්‍යන්තර සබඳතා,විදේශ විනිමය අනුපාතය, ඉතුරුම්, ආයෝජන (නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් පිළිතුරු 02 සඳහා ල.01)

(ආ) - වැඩි නිෂ්පාදනයක් කල හැකිවීම
- ඉහළ ගුණාත්වයෙන් යුතු නිමවුම් බිහි කිරීම
- ලාභය උපරිම කර ගත හැකි වීම
- කාලය ඉතිරිවීම

- ගුණාත්වය ආරක්ෂා වීම
- මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව කල හැකි වීම
- වෙළඳාම වැඩිවීම
- පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගත හැකි වීම

(නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සඳහා ල.01)

iii.යහපත් බලපෑම්- ව්‍යාපාර ශක්තීන් හඳුනාගත හැකි වීම
- ව්‍යාපාර අවස්ථා හඳුනාගත හැකිවේ.

(නිවැරදි පිළිතුරට ල.1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සඳහා ල.01)

අයහපත් බලපෑම්- ව්‍යාපාර දුර්වලතා හඳුනාගත හැකි වීම
- ව්‍යාපාර තර්ජන හඳුනාගත හැක වීම

(නිවැරදි පිළිතුරට ල.1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සඳහා ල.01)

iv.අ) - ගිණුම්කරණ කටයුතු පරිගණකය මගින් සිදු කිරීම.
- දුරකථන මගින් ගණුදෙනුකරුවන් සමග තොරතුරු හුවමාරු කිරීම.
- විද්‍යුත් තැපෑල භාවිතා කිරීම.
- කෙටි පණිවිඩ සේවාව භාවිතා කිරීම.
- අන්තර්ජාලය හරහා විවිධ ගෙවීම් කටයුතු සිදු කිරීම.
- විද්‍යුත් මුදල් ගෙවීම් ක්‍රම භාවිතා කිරීම.
- අන්තර්ජාලය ඔස්සේ බැංකු ගණුදෙනු සිදු කිරීම.

(පිළිගත හැකි නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සඳහා ල.01)

ආ)- ගණුදෙනු කිරීම පහසු වීම.
- කාලය සහ ශ්‍රමය ඉතිරි වීම.
- මූල්‍යමය ගණුදෙනු ඉතා ඉක්මනින් සපුරා ගත හැකි වීම.
- මුදල් එහා මෙහා ගෙන යාමේ දී ආරක්ෂාව සම්බන්ධයෙන් මතුවන ගැටළු ඇති නොවීම.
- ඕනෑම අවස්ථාවක ,ඕනෑම වේලාවක බැංකුවට නොගොස් තම මුදල් පාලනය කල හැකි වීම.
(නිවැරදි පිළිතුරකට ල.1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සදහා ල.01)

4)i) අ) හිමිකාරිත්වය අනුව , අරමුණු අනුව, පරිමාණය අනුව
(නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සදහා ල.01)

ආ) සමූපකාර, රාජ්‍ය සංස්ථා
(නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සදහා ල.01)

ii) අ) වාචිකව, ලිඛිතව, ඇඟවීමෙන් (ව්‍යාංගයෙන්)
(නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් පිළිතුරු 02 සදහා ල.01) ආ)

| | කේවල ස්වාමි ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
|---|---|---|
| අයිතිය | තනි පුද්ගලයෙකු සඳහා | හවුල්කරුවන් සතුය. |
| ප්‍රාග්ධන සම්පාදනය | තනිව සිදු කරයි. | හවුල්කරුවන් විසින් සිදු කරයි. |
| ලාභය භුක්ති විදීම | අයිතිකරු තනිව භුක්ති විදියි. | හවුල්කරුවන් අතර බෙදා හැරෙයි. |
| තීරණ ගැනීම | තනිව සිදු කරයි. | හවුල්කරුවන් විසින් සිදු කරයි. |

(නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් පිළිතුරු 02 සදහා ල.01)

iii) අ) 1. කළමණාකරන කටයුතු - අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් (ල.1/2)
2. ප්‍රාග්ධන සම්පාදනය - කොටස් නිකුත් කිරීමෙන් (ල.1 /2)
ආ) - අයිතිය සහ පාලනය රජය සතු වීම.
- නෛතික පුද්ගලභාවයක් තිබීම.
- ලියාපදිංචිය අනිවාර්ය වීම.
- විශේෂ හෝ පොදු පනතක් යටතේ ආරම්භ කල හැකි වීම.
- අඛණ්ඩ පැවැත්මක් තිබීම.
- සේවා සැපයීම අරමුණින් පිහිටු වීම.
- වගකීම රජය සතු වීම. (නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් පිළිතුරු 02 සදහා ල.01)

iv) අ) - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
(පිළිගත හැකි නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සදහා ල.01)

ආ) - අනන්‍යතාවයන් ලැබීම.
- ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම.
- රජයෙන් ලබා දෙන දිරිගැන්වීම් ලබා ගැනීමට සුදුසුකමක් වීම.
- ණය ලබා ගැනීමේ දී පහසුවක් ලැබීම.
( නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් නිවැරදි පිළිතුරු 02 සදහා ල.01)

5)i) ආ) ව්‍යාපාරයක් සහ වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරු වීම ගණුදෙනුවක් නම් වේ.
(නිවැරදි පිළිතුරට ලකුණු 01)

ආ)**අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක්** ලෙස ඇතිවන **අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ** ව්‍යාපාරය විසින් **පාලනය කෙරෙන සම්පත්** වත්කම් නම් වේ.
(ඉරි ඇඳි පද සහිත නිවැරදි පිළිතුරට ලකුණු 01. එසේ නොමැති නම් ලකුණු 1/2)

ii) 1. 2018.09.05 අත්පිට විකුණුම් රු. 150,000 යි. (වෙනත් කුමන හෝ ආදායමක් වුවත් ලකුණු දෙන්න.) ල.01

2018.09.12 ණයට බඩු තොග ලබා ගත්තා රු. 50,000 (ල.01)
2018.09.18 පිරිවැය රු. 30 000 ක් වූ භාණ්ඩ තොග රු. 50,000 කට ණයට විකුණුවා. (ල.01)
2018.09.25 රු. 10 000 ක ණයගැතියන් පියවීම සඳහා ලද මුදල් රු. 9000 දුන් වට්ටම රු. 1000(ල.1)
(වට්ටම පිළිබඳව සටහන් වී නොමැති නම් ල. 1/2)

(දින සහ වටිනාකම් සහිත නිවැරදි පිළිතුරට නියමිත ලකුණු ප්‍රමාණය ලබා දෙන්න. එසේ නොමැති පිළිතුරු සඳහා ල. 1/2 බැගින් දෙන්න)

2. ප්‍රාග්ධනය (2018.09.01) රු. 150,000

| | | |
|---|---|---|
| + ආදායම් | රු. 200 000 | - (අත්පිට සහ ණයට විකුණුම් වල අගය) |
| | රු. 350 000 | |
| - වියදම් | රු. (31 000) | - (විකුණුම් පිරිවැය සහ දුන් වට්ටම් වල අගය) |
| 2018.09.30 දිනට හිමිකම | රු. 319 000 | - ( ල.01) |

(කුමන හෝ ආකාරයකින් සිසුවා නිවැරදි පිළිතුර ලබාගෙන ඇත්නම් ලකුණු දෙන්න.)

iii) 1. යන්ත්‍ර ගිණුම හර රු. 100, 000 (ල.1/2)
සීමාසහිත ජිනසේන සමාගමබැර රු. 100 000 (ල.1/2)

2. සේවක වේතන ගිණුම හර රු. 25 000 (ල.1 /2)
බැංකු ගිණුම බැර රු. 25 000 (ල.1 /2)

3. මුදල් පොත හර රු. 100 000 (ල.1 /2)
බැංකු ගිණුම බැර රු. 100 000 (ල. 1/2)

4.බැංකු ගිණුම හර රු. 30 000 (ල.1/2)
සමන්ගේ ගිණුම /ණයගැති ගිණුම බැර රු. 30 000 (ල.1/2)

5. ගැනිලි ගිණුම හර රු. 30, 000 (ල. 1/2)
බැංකු ගිණුම බැර රු. 30,000 (ල. 1/2)
(වටිනාකම් නොමැතිව ද්විත්ව සටහන ලියා ඇත්නම් නියමිත ලකුණු ප්‍රමාණයෙන් භාගයක් ලබා දෙන්න.)

**6)**i) අ) - ව්‍යාපාරයේ නම හා ලිපිනය
- අනුක්‍රමික අංකය
- ගණුදෙනුව සිදු වූ දිනය
- ගණුදෙනුවට සම්බන්ධ අනෙක් පාර්ශවය
- ගණුදෙනුවට සම්බන්ධ විස්තර
- ගණුදෙනුවේ මූල්‍යමය වටිනාකම
- ගණුදෙනුව පිළිබඳව වගකීම භාර ගන්නා නිළධාරියාගේ අත්සන

(නිවැරදි පිළිතුරකට ල. 1/2 බැගින් නිවැරදි පිළිතුරු 2 සඳහා ල. 01)

ආ) මූලික සටහන් පොත් වල ගණුදෙනු වාර්තා කිරීමේ දී ඊට අදාල තොරතුරු ලබා ගන්නේ මූලාශ්‍ර ලේඛන වලිනි. (ඉරි ඇදි පද සහිත නිවැරදි පිළිතුරට ල. 01. එසේ නොමැති නම් 1/2)

ii) 1.

ගැනුම් ජර්නලය

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| 2018.10.08 | 112 | මුදිත | 33 250 (ල.1) | |
| 2018.10.21 | 35 | කරුණාරත්න ව්‍යාපාරිකයෝ | 20 000( ල.1/2) | |
| 2018.10.30 | 118 | මුදිත | 15, 000(ල.1/2) | |
| 2018.10.31 | - | ගැනුම් ගිණුමට ජර්නලය | 68,250 (ල.01) | |

(දිනය , ඉන්වොයිස් අංකය, සැපයුම්කරු, මුළු වටිනාකම යන සියළු තොරතුරු සම්පූර්ණ සහ නිවැරදි නම් පමණක් අදාල ලකුණු ලබා දෙන්න. එසේ නොමැති නම් ලකුණු නොමැත.)

මුදිතගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2018.10.08 | ගැනුම් | | 33 250 ල.1/2 |
| | | | | 2018.10.30 | ගැනුම් | | 15 000 ල.1/2 |

කරුණාරත්න ව්‍යාපාරිකයෝ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2018.10.21 | ගැනුම් | | 20 000 ල.1/2 |

ගැණුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | ණය හිමියෝ | | 68 250 | | | | |

(නියමිත ලෙජර් ගිණුම් ආකෘතිය සහිතව තොරතුරු සම්පූර්ණ නම් පමණක් අදාල ලකුණ ලබා දෙන්න. එසේ නොමැති නම් ලකුණු නැත.)

iii) අ) 1. රු. 200 (ල. 01)

2. රු. 2800 (ල. 01)

අ) තැපැල් වියදම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 (ල.1/2) | සුළු මුදල් | | 560 | | | | |

ගමන් වියදම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | සුළු මුදල් | | 320 | | | | |

ලිපිද්‍රව්‍ය ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | සුළු මුදල් | | 520 | | | | |

විවිධ වියදම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | සුළු මුදල් | | 400 | | | | |

ගෙන ඒමේ කුලී ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | සුළු මුදල් | | 500 | | | | |

විජය ව්‍යාපාරිකයෝ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | සුළු මුදල් | | 500 | | | | |

(නියමිත ලෙජර් ගිණුම් ආකෘතිය සහිතව තොරතුරු සම්පූර්ණ නම් පමණක් අදාල ලකුණ ලබා දෙන්න. එසේ නොමැති නම් ලකුණු නැත.)

7)i) අ) වගකීම් පිළිබඳ රීතියට අනුවය. (ල. 01)

ආ) - ශේෂ පිරික්සුමේ සමානත්වයට බල නොපාන වැරදි (ල. 1/2)

- ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපෑමක් ඇති කරන වැරදි (ල. 1/2)

ii) 1. බැංකු ගිණුම ( සංශෝධිත)

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම(රු) | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2018.10.31 | ශේෂය ඉ/ගෙ | | 6400 | 2018.10.31 | ස්ථාවර නියෝග | | 3200.00 (ල.1/2) |
| 2018.10.31 | සෘජු ප්‍රේෂණ | | 7000 | 2018.10.31 | බැංකු ගාස්තු | | 500(ල.1/2) |
| | | | | 2018.10.31 | ශේෂය ප/ගෙ | | 9700(ල.1/2) |
| | | | 13400 | | | | 13400 |
| 2018.11.01 | ශේෂය ඉ/ගෙ | | 9700 | | | | |

ලකුණු දීම ( ස්ථාවර නියෝග, සෘජු ප්‍රේෂණ, බැංකු ගාස්තු නිවැරදිව සටහන් කිරීමට සහ බැංකු ගිණුම තුලනය කර ශේෂය ප/ගෙ සදහා එක් අයිතමයකට ල 1/2 බැගින් ල.02)

කසුන්ගේ ව්‍යාපාරයේ

2018 ඔක්තොම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

| | රු. | රු. | |
|---|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 9700.00 | (ල. 1/2) |
| එකතු කලා | | | (ල. 1/2) |
| නිකුත් කලා නමුත් බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් | | 8400.00 | |
| | | 18100.00 | (ල. 1/2) |
| අඩුකලා | | | (ල. 1/2) |
| තැනපත් කල නමුත් නිශ්කාශනය නොවු චෙක්පත් | | (11400).00 | |
| 2018.10.31 දිනට බැංකු ප්‍රකාශනයේ සදහන් ශේෂය | | 6700.00 | (ල. 1/2) |

III පොදු ජර්නලය

| දිනය | වව්චර් අංකය | විස්තරය | ලෙ.පි. | හර(රු.) | බැර(රු.) |
|---|---|---|---|---|---|
| 2018.20.31 | | යන්ත්‍ර අළුත්වැඩියා වියදම් ගිණුම හර<br>යන්ත්‍ර ගිණුම<br>(යන්ත්‍ර අළුත්වැඩියා වියදම යන්ත්‍ර ගිණුමට හර කිරීමේ වැරැද්ද නිවැරදි කිරීම) | | 10 000 | |
| 2018.10.31 | | ගැනුම් ගිණුම හර<br>ණයහිමි ගිණුම<br>(ගැනුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් නොවීමේ වැරැද්ද නිවැරදි කිරීම) | | 25 000 | 25 000 |
| 2018.10.31 | | ණයහිමි ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(ණයහිමියන්ට මුදල් ගෙවීම ණයහිමි ගිණුමේ සටහන් නොවීමේ වැරැද්ද නිවැරදි කිරීම) | | 5000 | 5000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2018.10.31 | | අවිනිශ්චිත ගිණුම හර<br>ලිපිද්‍රව්‍ය ගිණුම<br>(ලිපිද්‍රව්‍ය වියදම වැඩියෙන් සටහන් වීමේ වැරැද්ද නිවැරදි කිරීම) | | 1800 | 1800 |

ලකුණු දීම (සංලක්ෂය සහිත නිවැරදි ජර්නල් සටහනට ල. 01 සංලක්ෂය නොමැති නම් නිවැරදි ජර්නල් සටහනට ල. 1/2)

අවිනිශ්චිත ගිණුම

| **දිනය** | **විස්තරය** | **ලෙ.පි.** | **වටිනාකම (රු)** | **දිනය** | **විස්තරය** | **ලෙ.පි.** | **වටිනාකම (රු)** |
|---|---|---|---|---|---|---|---|
| (ල.01) | ශේෂ පිරික්සුමේ වෙනස | | 3200 | | ණයහිමි | | 5000 (ල.1/2) |
| (ල.01) | ලිපිද්‍රව්‍ය | | 1800 | | | | |
| | | | 5000 | | | | 5000 |